කෙටිකතාව

ඩබ් එච් උපසේන

බ්‍රසිල ලේඛක, හරිකුවෙස් ඩිලිමා බරෙටෝ කළු සුදු දෙමාපිය යුවලකට දාව උපන් හරිකුවෙස් ඩිලිමා බරෙටෝ වෘත්තියෙන් සිවිල් සේවකයෙක් විය. බ්‍රසිලයේ ශ්‍රේෂ්ට නවකතාකරුවකු වශයෙන් පිදුම ලැබූ ඔහු වඩාත් ප්‍රසිද්ධියට පත්වූයේ සමාජ විචාරකයකු වශයෙනි. ඇමෙරිකානු සාහිත්‍ය විචාරකයකු වන ඩේවිඩ් ජැක්සන් පවසන්නේ, ඩිලිමා බැරෙටෝ සිය ලේඛන කලාව තියුණු සාමාජ විචාරක අවියක් ලෙස යොදා ගෙන තිබෙන බවය. 1915 දී ඔහු ලියා පල කළ ද triste flim de policorpo quarema නැමැති නවකතාවෙන් ඔහු සමස්ත බ්‍රසිලියානු සමාජය පිළිබඳවම මහා ප්‍රහසන චිත්‍රයක් මවා පායි.

බ්‍රසිලියානු සාහිත්‍යයට කළ මහැගි සේවාව වෙනුවෙන් සිය ජීවිතයේ අවසාන කාලයේදී විශේෂ සම්මානයක් බරෙටෝ වෙත ප්‍රදානය කරන ලදී. මේ කෙටිකතාව ඔහු විසින් 1920 දී ලියා පල කළ කෙටිකතා සංග්‍රහයක එන The man who knows Javanese නම් කෙටිකතාවේ සිංහල අනුවාදයයි.



කැස්ට්‍රෝ මට හම්බවුණේ කාලෙකට පස්සේ. මිනිහා මගේ හොඳ මිතුරෙක් ඉතින් එහෙම කෙනෙක් ගාවෙදි දොඩමළු වන එක අහන්න දෙයක්යැ. ඉතින් ජීවිතේ බොහොම ගෞරවා-න්විතව කළ යුතු දේවල්වලින් යටි මඩි ගැසූ හැටි මට බොහොම සැහැල්ලුවෙන් විස්තර කරන්න ඔහු ඉදිරියේදී පුළුවන් වුණා. මනාවුස්වලදී ඒ කාලෙ මම කරපු නිතිඥ වෘත්තිය සඟව ගෙන මගේ ගනුදෙනු කරුවන්ගෙ වැඩි ප්‍රසාදයක් දිනා ගන්නෙ ශාස්ත්‍රකාරයකු ලෙස හෝ ඉන්ද්‍රජාලිකයකු ලෙස පෙනී සිටිමිනුයි. අපි බීම විදුරු දෙක බී හමාර කළ විට කැස්ට්‍රෝ මම කරපු විස්තරවලින් හොඳටම පුදුමයට පත්වෙලා හිටියෙ. 'උඹ නං මාර ජීවිතයක් නෙ බං ගත කරල තියෙන්නෙ.'

ප්‍රතිචාරයෙන් මම වඩාත් ධෛර්යයට පත්වුණා.' කැස්ට්‍රෝ. මේ සමාජය දිහා බලල අපිට අපේ ජීවිතේ ගැන බොහොම ලස්සන දේවල් ලියන්න පුළුවන්. උඹ විශ්වාස කරනවද මන්ද මම ජාවා භාෂාව ඒ කියන්නෙ මලය රටේ භාෂාව උගන්න ගුරුවරයෙක් වෙලා අන්තිමට කවුන්සල්වරයෙක් දක්වා ඉහළ ගියා කියල?'

'ඇත්තටම කියාපං මොකක්ද වුණේ කියල. උඹට තව බීරර් එකක් ගෙනැල්ල දෙන්නද?'

'හරි... හරි.... මම කතාව පටන් ගත්ත. මම රියෝවලට එන කොට අතේ පිච්චියක් නෑ. මම එක බෝඩිමක ඉඳල තව එකකට හිමිට මාරු වෙච් හිටියේ. කියක්වත් හොයා ගන්නෙ කොහොමද කියල නිනව්වක් නැතිව. ඔන්න එක දවසක් කොමරසියෝ සඟරාවෙ මෙන්න මේ වගේ දැන්වීමක් තිබුණ. 'ජාවා භාෂාව දන්න ගුරු-වරයෙක් ඕනෑ කර තිබේ.'

. මේ රස්සාවට ඉල්ලන ගොඩක් අය නැතිව ඇති කියල මට හිතුන. මේ ජාවා භාෂාවෙ වචන දෙකක් තුනක් ඉගෙන ගන්න පුළුවන් නං මට ඇහැක් වෙයි මේකට උත්සාහයක් දාන්න.'

. මම මොකුත් හිතන්නෙ නැතිව එහෙමම ගියා ලයිබ්‍රියට. ඊට පස්සෙ විශ්ව කෝෂෙ ජේ අකුර තියෙන කාණ්ඩෙ අරගෙන බැලුව ජාවා රට ගැනයි. ජාවා භාෂාව ගැනයි මොකක් හරි විස්තරයක් තියෙනවද කියලා. මං හිතුව හරි. විනාඩි ගාණක් ඇතුළත දැන ගත්ත, ජාවා කියන්නෙ සොන්ඩා කියන දූපත් සමූහය අතර තියෙන විශාල දූපතක් කියන එක. ඒක, ඒ කාලෙ ලන්දේසි යටත් විජිතයක්. එතකොට ජාවා භාෂාව පවුලට අයිති ඒ රටටම ආවේණික භාෂාවක්. ඒ වගේම ඒ රටටම අදාළ සාහිත්‍යයක් තියෙනවා. ජාවා භාෂාවෙ අකුරු පරණ හින්දි හෝඩියෙ අකුරුමයි.....

. විශ්ව කෝෂයෙන්ම මම දැනගත්ත ජාවා භාෂාව ඉගෙනගන්න හදාරන්න ඕනි පොත් මොනවද කියලත්. ඉතින් ඒ එක පොතක් අරගෙන භාෂාවෙ හෝඩිය හොයා ගෙන අකුරු ශබ්ද කරන විදියත් බලල ඒවා මතක් කර කර ආයෙත් පාර දිගේ ඇවිදින්න පටන් ගත්ත....

. මෙහෙම ඇවිද ගෙන යනකොට ජාවා භාෂාවෙ රූපාක්ෂර මගේ හිත ඇතුළෙ නටන්න පටන් ගත්ත. මම විටින් විට මං ලියාගත්ත කෙටි සටහන් දිහැත් බැලුව. ළඟ උද්‍යානයටත් ගිහිල්ල අකුරු වැල්ලේ ඇන්ද. ඒ ඒව මතකයෙ රැඳවගන්නයි. අනික අතත් හුරුවෙනවනෙ. එහෙම ලිව්වම.

. මම ආයෙත් අර දැන්වීමෙ කියවල බැලුව. හරි, අහල තිබුණෙ ජාවා භාෂාව උගන්වන ගුරුවරයෙක් ගැන තමයි. මම ආයෙත් ලයිබ්‍රියට ගිහින් ජාවා භාෂාව ගැන තව ඉගෙන ගන්න පටන් ගත්තා. ජාවා භාෂාව උගන්වන ගුරුවරයෙක් හැටියට මම ඉගෙන ගන්න ඕනි. ඒකෙ හෝඩිය විතරද නැත්නම් භාෂාවෙ ඉතිහාසයත් උගන්වන්න වෙයිද යන ප්‍රශ්නයත් මගේ හිතේ තිබුණ. මට කොහොමටත් ජාවා භාෂාවෙ ආශ්‍රිත ග්‍රන්ථ ගැනයි, එහි ඉතිහාසය ගැනයි උනන්දුවක් තිබුණ. ඒ හරිය උගන්වන්න ලැබුණොත් කොච්චර එකක්ද? ඒත් මට එදා එච්චරම දෙයක් ඉගෙන ගන්න නං බැරි වුණා.....

. දවස් දෙකකට පස්සෙ මට ලියුමක් ආවා රොක් කොන්ඩ් කියන සමාගමේ සේවය කරන ආචාර්ය මනුවෙල් ෆෙලිසියානෝ හම්බ වෙන්න කියල. මේ තනතුර ගැන කතා කරගන්න....
. මම ඉතින් වැඩෙට සූදානම් වුණා. මම එම භාෂාවෙ ලේඛකයින් කීපදෙනෙක්ගෙ නම් ටිකකුයි, 'කොහොමද සැප සනීප?' කියල ජාවා භාෂාවෙන් අහන හැටියි. ඒකෙ ව්‍යාකරණ රීති දෙක තුනකුයි ඉගෙන ගෙන තව තවත් සූදානම් වුණා....

. නියමිත දිනයේ ලිපිනය හොයාගෙන දහඩිය පෙරා ගෙනම එතෙන්ට එවිදින්න ගත්තා. පරණ අඹ ගස්වලින් පිරිච්ච නිකං අත් ඇරල දාපු වගේ නිවාසයක්. ඒක. ඒක දිරා යමින් තිබෙන එකක් වගෙයි මට පෙනුනෙ. මට ඒ වෙලාවෙ හිතුන දෙයක් තමයි, මේ විදියට ගෙයක් දිරා දිරා හැලි හැලි යමින් තියෙන්නෙ, දුප්පත්කමට වඩා ඉන්න මිනිස්සුන්ගෙ නොසැලකිල්ල හින්ද කියල. මට තේරුන හැටියට අවුරුදු ගාණකින් බිත්තිවල තින්ත ගාලත් නැහැ. ඒවයෙ සායම් තීරු පිටින් ගැලවිලා, කඩතොලු මතුවෙමින් තිබුණ. විදුරු උළු කැටවල කාලය ඉකුත් වෙලා. තැන් තැන්වල කඳලි නැහැ. ඒව මට පෙනුනෙ හරියට කිසිම සැලකිල්ලක් නොදක්වපු දත් ඇන්දකට වෙච්ච දෙයක් වගෙයි. .

. එතකොට ගෙවත්ත පුරාම වල් වැවිල තිබුණො හරියට නැතින් තරන තිබුණ මල් පඳුරුවලින් පලිගන්න ආතුමණය කරන්න හදනව විදියටයි. යාන්තම් පණ බේරගෙන වගේ මල් දෙක තුනක් පිපිල තිබුණ....

. මම ඉතින් දොරට තට්ටු කළා. හුඟ වේලාවක් ගියා ඒක ආරෙන්න. ටිකින් ටික අඩි සද්දෙ ඇහෙන්න ගත්ත. ගෙදර තිබුණ පෞරාණිකකම නිසා මා හමුවෙන්න එන මිනිසා කෙරෙහි මා තුළ කිසියම් ගෞරවයක් පැලපදියම් වෙලා තිබුණට මිනිහ දැක්කට පස්සෙයි හිතුවෙ මෙතැනින් පැනල යන්නයි. ඒ ඔහුගෙ වයස නිසා ඇතිවන ගෞරවාන්විත හැඟීම හින්ද ඔහුව මගේ ගෝලයා කරගෙන මේ වගේ රැවටීමකට හසු කරන්න හොඳ නැහැ කියන සිතිවිල්ල ඇති වෙච්ච හින්දයි. ඒත් මම දෙගිඩියාවෙන්ම එතනම රැඳිල උන්නා....

'මම තමයි, අර ජාවා භාෂාව උගන්වන්න ආපු ගුරුවරයා. ඔබතුමා අර දැන්වීමෙන් ඉල්ල තිබුණෙ.' මම කථා කළා මුලින්ම....

ඊට පස්සෙ ඔහු බොහොම හෙමින් මෙහෙම ඇහුවා. 'එහෙම නං මහත්තය මට ජාවා භාෂාව උගන්වන්න කැමතියි.?'

. මගෙන් පිළිතු ආවේ මං හිතන්නත් ඉස්සර වෙලා... 'ඔව්.. ඔව් මට පුළුවන්.'

. සමහර විට මහත්තයට පුදුම ඇති. මම තමයි ජැකුවෙන්වල බරන්වරයා මට ඕන කරන්නෙ පරම්පරාවෙ පොරොන්දුවක් ඉෂ්ඨ කරන්න. සමහරවිට ඔගේ දන්නවද දන්නෙ නෑ මම තමයි, ඇල්බරනාස් කවුන්සිල්වරයාගේ මුණුපුරා. එයා ලන්ඩන් ගියාපු වෙලාවක අමුතු භාෂාවකින් ලියාපු පොතක් ගෙනැල්ල තියෙනවා. ජීවත්වෙලා ඉන්න කාලෙදි එයා ඒ පොත ගැන බොහොම ගෞරවයෙන් කථා කළේ. තමන්ට කරපු උපකාරයට කළගුණ සැලකීමක් විදියට කවුරු හරි කෙනෙක් දුන්න එකක්. දුන්න මනුස-ස කියල තියෙන්නෙ මේක ජාවා භාෂාවෙන් ලියල තියෙනව කියලයි. මේ පොත අයිතිකාර ගත්ත කොනාගෙ ඔක්කොම අපල දුරුවෙලා වාසනාව උදාවෙනව කිව්වලු....

'සීය අපේ තාත්තට කියල තියෙන්නෙ. මට නං මේව ගැන එච්චරම විශ්වාසයක් නැහැ. කො-හොම වුණත් මේක උඹේ පුතාටත් පවරපන්.' කියලයි. 'එයාට හරි කියපන් මේකෙ තියන ඒව අවබෝධ කරගන්න.' කියලත් කිව්ව.....

. තාත්තා මහලු වෙනකල්ම මේ ගැන කිසිම විශ්වාසයක් තිබ්බෙ නැහැ. නමුත් පොත එයා ගාවම තියාගත්ත. මැරෙන කොට තමයි, මේ පොතේ වග මට කිව්වෙ. හැබැයි මමත් මේ ගැන එච්චරම විශ්වාසයක් තිබ්බේ නැහැ. මං මගේ පාඩුවෙ ජීවත් වුණා. ඉතින් මේ ගැන නිනව්වක් නැති වුණා. ඒත් මෑත කාලෙදි මගේ හිතට වද දෙන ප්‍රශ්න වැලක්ම ඇතිවුණා. අවාසනාවන්ත සිද්ධීන් ගණනාවකට මූන දෙන්න සිද්ධ වුණා. අන්න එතකොට තමයි, මට මේ වාසනාව ගෙන දෙන පොත ගැන මතක් වුණේ. මට දැන් මේක කියවන්න ඕනි. තේරුම් ගන්න ඕනි. මොකද මේ ජීවිතේ අවසාන කාලෙදි තවත් මේ වගේ දේවල් ඇති වෙලා දුප්පත් වෙන්න මං කැමති නැහැ. ඒකයි, මම මේ ජාවා භාෂාව ඉගෙන ගන්න හදන්නෙ.'

. ඔහු නිහඬ වූ මට පෙනුනේ ඔහුගේ ඇස් දුම-ාරයකින් බැඳිල වගේ තෙත් වෙලා තියෙනව. මිනිහ සේවකයකුට කියල පොත මං අතට පත් කළා..

. ඒක හම් බැම්මෙන් බැඳල තිබුණ විශාල පොතක්. පරණ වීම නිසා කහපාට වේගෙන යන කොළවල අකුරු ලොකුවට අච්චු ගහලයි තිබුණෙ. වෙලාවට පෙරවදන තිබුණො ඉංග්‍රීසියෙන්. ඒකෙන් දැනගත්ත පොත ලියල තියෙන්නෙ, කුලුන්ග කියල ජාවා රජ් සම්භාව්‍ය ගණයේ ලේඛකයෙක් කියල....

. මම වහාම බැරන්වරයට දැන්නුව ඒ වග. හැබැයි මම කිව්වේ නැහැ, ඒ විස්තර අහුල ගත්තෙ, පෙරවදනෙන් කියල. ඉතින් ඒ වග නොදත් මහලු මිනිසා මට බොහොම ගරු බුහුමන් දක්වන්න ගත්ත. ඒ මට ජාවා භාෂාව ගැන දැනුමක් ඇත්තෙකු ලෙස සළකලයි. අනික, මම විස්තර කරන කොට එහෙම කළේ පොතට සෙමෙන් තට්ටු කර කර ජාවා භාෂාව ගැන ඉහළම දැනීමක් හඟවමිනුයි. අවසානයේදි අප ගෙවිය යුතු ගාස්තු හා කොන්දේසි හා පැමිණිය යුතු වේලාවල් කතා කරගත්ත. මං මිනිහට සහතිකයක් දුන්න අවුරුද්දක් යන්න කලින් පොත කියව ගන්න පුළුවන් වෙන්න භාෂාව උගන්වන්නම් කියල.....

. ඉතින් මම මිනිහට එදා මුල්ම පාඩම කළා. ඒත් මිනිහ මං තරම් වැඩෙට අවධානයක් යො-දවන බව පෙනුනේ නැහැ. මිනිහට අඩුගානෙ හෝඩියෙ අකුරු හතරක්වත් කියවන්නවත් ලියන්නවත් බැරිවුණා. මාසයක් ගත වුණා. හෝ-ඩියෙ භාගයක් උගන්වන්න. අලුත් දෙයක් ඉගෙන ගන්න කොට කලින් ඉගෙනගත් දේවල් අමතක වෙන ගතියකුත් මිනිහට තිබුණ....

Authors Composers & Performers Organization of Sri Lanka
92/1, Jaya Road, Udahamulla, Nugegoda, Sri Lanka.
email: acposlk@yahoo.com cmoimk@yahoo.com | web: www.acposl.com | phone: 011 2835791, 075 7287487

යොමු අංක S/LD/15/001 5th May 2015

සියලුම දෙනාගේ දැනගැනීම පිණිසයි

Authors Composers & Performers Organization of Sri Lanka (ACPO), ශ්‍රී ලංකාව තුළ බඳවන්න එකම නීතානුකූල සංවිධාන සනාතනය සඳහාකරණ ආයතනය වේ. එය 2003 අංක 36 දරණ මුද්‍රිතය දේපල පනතින් ආරක්ෂාය කෙරෙන්න වූ සියලුම සංවිධාන නිර්මාණ කරුවන්ගේ නිර්මාණ අයිතිය, කුප්තිය මෙන්ම ඒ හා අදාළ වාණිජමය ප්‍රතිලාභ හා සනාතාන සඳහාකරණය කරනු ලබයි.

අප සංවිධානයේ පූර්ණ සාමාජිකත්වය ඇති අනවද්‍යත්ත විශාරද ගුණදාස කපුගේ මහතා විසින් සංගීතය නිර්මාණය කර ඇති සියලුම නිර්මාණ සඳහා වූ පූර්ණ අයිතිය 2003 අංක 36 දරණ මුද්‍රිතය දේපල පනත ප්‍රකාරව හිමිවන්නේ ඔහුගේ ආත්මීය දොක්ටර්වරය ඇති මිරිද වත දේමා කපුගේ මෙන්මියටයි. එබැවින් අංක විශාරද ගුණදාස කපුගේ මහතා වෙනුවෙන් අප සංවිධානයේ පූර්ණ සාමාජිකත්වය උපුලන්නීය.

එහෙයින් විශාරද ගුණදාස කපුගේ මහතා විසින් නිර්මිත සියලුම සංගීත නිර්මාණ සවිව ඉදිරිපත් කිරීම, Radio/TV මාධ්‍ය භාවිතය හා නවීන තිෂ්ඨාදාන සඳහා බඳවනු තිෂ්ඨාගතයය කිරීම හා එම සියලුම නිර්මාණ නව මාධ්‍ය (New Media) භාවිතය හෝ දැනට නොවරිත ඉදිරියේදී සොයාගැනීමට නියමිත සියලුම මාධ්‍ය සඳහා වූ භාවිතය වෙනුවෙන්ද බඳවනු ගියහුන් කිරීමේ පූර්ණ අයිතිය ඇත්තේ අප සංවිධානයට පමණි.

ඉහත සඳහන් අයිතය වැදගත් හා සියලුම වූ කාරණා නොසලකා හරිමින් විශාරද ගුණදාස කපුගේ මහතා විසින් නිර්මිත මොනයම් හෝ සංගීත නිර්මාණයක්, රටින් කොටසක්, එම ගායනාවක්, එසේ සංගීත සංයෝජනය හෝ එම කණ්ඩායම් ගෙනෙන පසුබිමකින් නොවර භාවිතා කිරීම 2003 අංක 36 දරණ මුද්‍රිතය දේපල පනත ප්‍රකාරව උපරිම දඬුවමකට යටත් කළ හැකි බරපතළ වරදක් වන්නේය. තවද එසේ භාවිතා කිරීම නීතානුකූල අප ආයතනය වෙනුවට විරුද්ධව අධිකරණ ක්‍රියා මාර්ගයකට යොමු කරවන බව සළකුවා මනාය.

ශ්‍රීලංකාවේ සංගීත නිර්මාණ අත් රටවල භාවිතය අධීක්ෂණය කරනු වස් ලොව පුරා විහිදී සිටින සහෝදර සනාතාන සඳහාකරණ ආයතන සමගින් අප ACPO සංවිධානයද ගිවිසුම් සඳහා එදාඕම දැනගෙන සිදුවන බව අවධානය කර සිටින අතර ඕස්ට්‍රේලියාවේ APRA | AMCOS සහෝදර සංවිධානය සමගින් මේ සඳහා කටයුතු කිරීමද ආරම්භ කර ඇති බව සතුටින් දන්වා සිටිමු. මේ ගිවිසුම් ඕස්ට්‍රේලියාව, නැස්මේනියාව හා ගවේෂණය යන දේශ සීමා තුළ මොහොමේ අලුත්කින් හෝ විශාරද ගුණදාස කපුගේ මහතාගේ නිර්මාණ අප ACPO ආයතනයේ ගෙනෙන බඳවනුලබයින් හොරව භාවිතා කිරීමේදී සිටින සැළස මෙයින් තවදුරටත් දැන්වා සිටිමු ළැබේ.

වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවිය www.acposl.com පිරික්සන සැළස තවදුරටත් දන්වා සිටිමු.

ස්තුතියි
සෙයිද් විජේවීර,

සර්මුදුලජෝසිංහල
බඳවනු හා මෙහෙයුම් ප්‍රධානී
ACPO ආයතනය
ශ්‍රී ලංකාව

එකසිතුව එකාමෙන් එකමිතය වේගයෙන්